# කළමනාකරණ කමිටු රැස්වීම

දිනය - 2022.05.23

වෙලාව - ප.ව 2.00

ස්ථානය - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප)

මූලාසනය - ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මහත්මිය (ප්‍රධාන ලේකම්)

සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

1. ඩබ්ලිව් .එම්. දයාවතී මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
2. ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
3. ඒ.එම්.එස්.මල්කාන්ති මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)
4. ජී.ඩබ්ලිව්.පී.පෙරේරා මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
5. කේ.ජී.එස්.ප්‍රසන්න මයා - ප්‍රධාන අභ්‍යන්තර විගණක
6. කේ.එන්.කේ.සිල්වා මිය - ආදායම් කොමසාරිස් (බ.ප)
7. පාලිත අබේවර්ධන මයා - ප්‍රධාන නීති නිලධාරී, නීති ඒකකය
8. ඩබ්ලිව්.ඒ.සී.එස්.ප්‍රියදර්ශනී මිය - අධ්‍යක්ෂ ( ආදායම්)
9. එම්.ඩබ්ලිව්.එස්.කුරේ මයා - අධ්‍යක්ෂ (අය වැය)
10. කේ.ජී.සුදර්ම සිසිර කුමාර මයා - අධ්‍යක්ෂ (සැලසුම්)
11. එන්.එච්.සුමින්ද මයා - අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)
12. ආශා පනාගොඩ මිය - අධ්‍යක්ෂ(ඉංජිනේරු)
13. ඒ.තලංගම මයා - මූලස්ථාන ඉංජිනේරු
14. කේ.එන්.සූරියආරච්චි මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)
15. ජේෂලා අබේසූරිය මිය - සහකාර ප්‍රධාන ලේකම්(පාලන)
16. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරී (ඉංජිනේරු)

ප්‍රධාන ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පැවති කළමනාකරණ කමිටු රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | මානව සම්පත් කළමනාකරණ පද්ධතිය සකස් කිරීම සම්බන්ධව | කළමනාකරණ තොරතුරු පද්ධතියට තොරතුරු ඇතුලත් කිරීම මඟින් කළමනාකරණ තීරණ වලට එළඹීමේදී එම කාර්යයන් පහසු කරලීම අරමුණ වූ නමුත් මෙම තොරතුරු පද්ධතිය තුළින් එම අපේක්ෂිත කාර්යය ඉටු නොවන බව සාකච්ඡා විය.<br>ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් මේ සම්බන්ධව පවත්වන ලද රැස්වීමේදී එළඹි තීරණයට අනුව පළමු අදියර වශයෙන් එක් එක් ආයතන මට්ටමින් දත්ත ඇතුලත් කර අවශ්‍ය මූලික තොරතුරු ලබා ගැනීම සඳහා විමසුම් **(Query)** සකස් කර පරිශීලන අතුරු මුහුණතක් **(Dashboard interface)** සකස් කර අවසන් කිරීමට තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) |
| 02 | පළාත් පාලන ආයතනවල දීර්ඝ කාලයක් සේවය කළ නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධව | පවතින තත්ත්වය අනුව මෙම කාල සීමාවේ ස්ථාන මාරු සිදු කිරීම තුලින් ප්‍රවාහන කටයුතු හා වෙනත් හේතූන් මත නිලධාරීන් අපහසුතාවට පත්විය හැකි බැවින් මෙම නිලධාරීන්ගේ ස්ථාන මාරු පසුවට කල් තබන ලෙසත් , අදාළ තොරතුරු එතෙක් රැස්කර තබා ගන්නා ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) |
| 03. | මාධ්‍ය ඒකකයේ නිලධාරීන්ගේ ගැටළුව සම්බන්ධව | මාධ්‍ය ඒකකයේ නිලධාරීන් රාජකාරී කටයුතු සඳහා සැලසුම් අංශයට අනුයුක්ත කල නමුත් ඔවුන්ගෙන් සැලසුම් අංශයට අදාළ සේවාවන් ඉටු නොවන බව අධ්‍යක්ෂ (සැලසුම්) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>එසේම තොරතුරු තාක්ෂණ ඒකකයේ දුමින්ද ප්‍රසාද් මහතාගෙන්ද ඵලදායී සේවාවක් නොලැබෙන බැවින් එම නිලධාරියාගේ ඉල්ලීමක්ද පවතින කොළඹ නගර සභාවට ස්ථාන මාරු කිරීම සුදුසු බව තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) |

| | | | |
|---|---|---|---|
| 04. | ආහාර අර්බුදයට මුහුණ දීම සඳහා බස්නාහිර පළාත තුල ගෙවතු වගා සංග්‍රාමයක් ඇරඹීම සම්බන්ධව | ඉදිරියේදී මුහුණ දීමට සිදුවන ලෝක ආහාර අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකාව වැනි රටවල් දැඩිලෙස පීඩාවට පත්වන බවත්, ඒ අනුව පවතින සාම්ප්‍රදායික ක්‍රමයන්ගෙන් පරිබාහිරව ගෙවතු වගා වැඩසටහනක් සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් වැඩ සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවයත් පෙන්වා දෙමින් මේ සම්බන්ධව ලේකම්වරුන්ගේ රුස්වීමේදී සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රධාන ලේකම් විසින් පැහැදිලි කරන ලදී.<br><br>ඒ අනුව පළාත තුල පවතින උපනතීන් හඳුනාගෙන කෘෂිකර්මය සම්බන්ධව දැක්මක් ඇතිව කටයුතු කල යුතු බවත් , වගා සංග්‍රාමයක් සඳහා සැලසුම් සහගත ක්‍රියාවලියක් ඔස්සේ වැඩසටහන ක්‍රියාත්මක කල යුතු අතර මේ සම්බන්ධව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ සහයෝගය ලබා ගනිමින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් ) හා අධ්‍යක්ෂ (සැලසුම්) විසින් මූලිකත්වය ගෙන සැලසුමක් සකස් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>තවද පූර්ව සූදානමක් ඇතිව වහ වහා පවතින ඉඩකඩ ප්‍රයෝජනයට ගෙන සියලු දෙනා ගෙවතු වගාව සඳහා යොමුවිය යුතු බවත් විශේෂයෙන් නාගරික කෘෂිකර්මාන්ත වැඩසටහන් ආදී පවතින කුඩා ඉඩකඩ ප්‍රමාණයද ප්‍රයෝජනවත් පරිදි යෙදවීමට ජනතාව යොමුකල යුතු බවද අවධාරණය කෙරිණි. එ අනුව ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ජනතාව පෙළඹවිය යුතු අතර ආහාර අර්බුදය නිසා අනාගතය අවිනිශ්චිත බැවින් සියලු නිලධාරීන්ද මේ සඳහා යොමු විය යුතු බවත් පළාතක් වශයෙන් බස්නාහිර පළාත මෙම කාර්යේදී සුවිශේෂී වගකීමක් ඉටු කිරීමේ අවශ්‍යතාවය ප්‍රධාන ලේකම් විසින් පෙන්වා දෙන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |
| 05. | ප්‍රසම්පාදන සැලසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | කාර්යාල කටයුතු වලට අදාළව ප්‍රසම්පාදන සැලසුම් අනුව පළමු කොටස සිදුකල නමුත් පවතින ප්‍රාග්ධන හිඟය මත ඉදිරි කටයුතු සිදු කිරීමේ ගැටළුවක් පවතින බවත් ඒ සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීම පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු විමසන ලදී.<br><br>ප්‍රසම්පාදන සැලසුම් වලට අනුව සියලුම කටයුතු සිදු කිරීමේ ගැටළුවක් පවතින නමුත් කාර්යාල කටයුතු පවත්වාගෙන යාමේදී අත්‍යාවශ්‍ය කාරණාවන් සඳහා කටයුතු කලයුතු බවත් ඒ අනුව අත්‍යාවශ්‍ය කටයුතු සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමා වෙත කරුණු ඉදිරිපත් කර විශේෂ අනුමැතියක් ලබා ගැනීමෙන් පසු කටයුතු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |

| | | | |
|---|---|---|---|
| **06.** | කාර්යය සාධන වාර්තාව සකස් කිරීම සම්බන්ධව | 2022.05.31 දිනට කාර්යය සාධන වාර්තාව ලබා දීමට කටයුතු කල යුතු බවත් , ඊට අදාළ තොරතුරු අමාත්‍යාංශ වලින් කල් වේලා ඇතිව නොලැබීමේ ගැටළුවක් පවතින බවත් ,එකම තොරතුර කිහිප තැනක සටහන් වීමේ ගැටළුවක් පවතින බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.මෙය කඩිනමින් සකස්කර අවසන් කල යුතු බවත් , එසේ ගැටළු මතුවිම තුළින් එය සකස් කරන නිලධාරීන් දැඩි අපහසුතාවට පත්වන බවත් වැඩි දුරටත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) විසින් පෙන්වා දෙන ලදී.<br>ඒ අනුව කිසියම් කරුණක් ඉදිරිපත් කිරීමේදී සියළුම මාණ්ඩලික නිලධාරීන් වගකීමෙන් කටයුතු කලයුතු බවත් , පහළ නිලධාරීන් විසින් සකස්කර ඉදිරිපත් කරනු ලබන කරුණු සම්බන්ධව නැවත අධීක්ෂණය කර නිවැරදි බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු බවත් ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |
| **07.** | සැලසුම් අංශයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ක්ෂේත්‍ර රාජකාරි වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම සම්බන්ධව | සැලසුම් අංශයේ ක්ෂේත්‍ර නිලධාරීන්ට අධීක්ෂණ නිලධාරියා විසින් ක්ෂේත්‍ර රාජකාරි පවරනු නොලැබුවත් ඔවුන්ගේ මාසික ඉදිරි වැඩසටහන් අනුව ගමන් වියදම් ගෙවීම් සිදු කිරීමේ ගැටළුවක් පවතින බවට අධ්‍යක්ෂ (සැලසුම්) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව දැනට පවතින තත්ත්වය මත ඉන්ධන හිඟය හා රාජ්‍ය වියදම් පාලනය සඳහා ක්ෂේත්‍ර රාජකාරීවල නිරත නොවන ලෙස මින් පෙරද නිලධාරීන් වෙත දන්වා ඇත. ඒ අනුව මේ වන විට සියලු ඉදිකිරීම් නවතා ඇති බැවින්ද , නිලධාරීන් විසින් ඉල්ලීම් සිදු කරන නමුත් ස්ථානීය පරීක්ෂණයන් සිදු නොකරන බවට කරුණු වාර්තා වී ඇති බැවින් ද, සැලසුම් අංශයේ නිලධාරීන් සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) හෝ අධ්‍යක්ෂ (සැලසුම්) විසින් නියම කරන ලද රාජකාරී සඳහා ක්ෂේත්‍ර රාජකාරීවල නිරත වී ඇතිනම් පමණක් ගෙවීම් සිදු කිරිමට කටයුතු කරන ලෙස තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් / මූලය) |
| **08.** | වී ග්‍රීන් වෙළඳ සැල කෘෂි සේවා අධිකාරියට පැවරීම සම්බන්ධව | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සුභ සාධන සංගමය මඟින් දැනට පළාත් සභා ගොඩනැගිල්ලේ පවත්වාගෙන යනු ලබන වී ග්‍රීන් වෙළඳ සැලෙහි වර්තමාන තත්ත්වය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි බැවින් කෘෂි සේවා අධිකාරිය වෙත පැවරීම සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( මූල්‍ය) විසින් යෝජනා ඉදිරිපත් කරන ලදී.<br>මේ සම්බන්ධව වැඩිදුරටත් ලේකම්වරුන්ගේ රැස්වීමේදී සාකච්ඡා කර තීරණයක් ගැනීමට තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 09. | ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ගමන් වියදම් දීමනාව වැඩි කිරීම සම්බන්ධව | තාක්ෂණික නිලධාරීන්ගේ ගමන් වියදම් සීමාව වැඩිකර දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( ඉංජිනේරු ) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>මීට පෙරද ඉන්ධන මිල ගණන් ඉහළ යාම නිසා සියලුම ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ගමන් වියදම් දීමනාවන් වැඩිකර දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර මේ වනතෙක් ඒ සම්බන්ධව අනුමැතිය ලබා දී නැත.ඒ අනුව එක් කොටසකට පමණක් එසේ වැඩි කිරීමේ හැකියාවක් නොමැති අතර, දැනට ඉදිකිරීම් කටයුතු සිදු නොවන බැවින් අත්‍යාවශ්‍යම අවස්ථාවකදී පමණක් ඒ සඳහා එක් තාක්ෂණික නිලධාරියකුගේ සේවය ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් , පොදු ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමෙන් පසු මේ පිළිබඳ කටයුතු කිරීමට තීරණය කරන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 10. | කාර්ය මණ්ඩල පුහුණු කටයුතු සිදු කිරීම සම්බන්ධව | පවත්නා ගමනාගමන අපහසුතාමත සහ වියදම් කළමනාකරණ ප්‍රතිපත්ති මත සියලුම කාර්යය මණ්ඩල පුහුණු කිරීම් නතර කිරීමට මේ වන විට පියවර ගෙන ඇති බවත් , සේවා අවශ්‍යතාව මත පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් විභාග වලට අවශ්‍ය පුහුණු කටයුතු , දෙමළ භාෂා ප්‍රවීණතාව හා දැනට සිදු කරමින් පවතින ඉංග්‍රීසි භාෂා පාඨමාලාවලින් පමණක් මේ වන විට පිරිස් පුහුණු අංශය මඟින් සංවිධානය කර පැවැත්වීමට කටයුතු කර ඇති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>ඒ අනුව පවත්නා තත්ත්වය සමථයකට පත්වන තෙක් සේවා අවශ්‍යතාවය මත පැවැත්වෙන පාඨමාලාවන් පමණක් පැවැත්වීම සුදුසු බව තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත